# සමාජානුයෝජනය විෂයෙහි පාසලෙහි භූමිකාව

ගබ්බෙල සුමනධම්ම හිමි

## හැඳින්වීම

පුද්ගලයා සමාජයට අනුව හැසිරීම හෙවත් අනුගත තත්ත්වයට පත් කිරීමේ දිගු කාලීන සමාජ ක්‍රියාවලිය සමාජානුයෝජනය යි. (අමරසේකර, 2016: 80). සමාජානුයෝජනය පිළිබඳ නිර්වචන රාශියක් ඇති අතර එහි ප්‍රභේද මෙන් ම කාරක ද විශාල වශයෙන් දක්නට ලැබේ. පුද්ගලයා පවුල නමැති ප්‍රාථමික සමාජානුයෝජන කාරකය මගින් මුල් වරට අවට පරිසරය හා සමාජය පිළිබඳ දැනුම ලබා ගනියි. පුද්ගලයාට මුලින් ම හමුවන සමාජ ඒකකය වශයෙන් පවුල හැඳින්වේ. එබැවින් දරුවකු පවුල මගින් දීර්ඝ කාලීන ව ප්‍රාථමික සමාජානුයෝජනය ලැබීම වැදගත් ය. මෙම අවධියේ පවුලෙන් ලැබෙන ශක්තිමත් අත්තිවාරම ඉදිරි අත්දැකීම් සඳහා ශක්තිය සපයයි. ප්‍රාථමික සමාජානුයෝජනයෙන් අනතුරු ව දරුවකු ද්විතීයක ආයතන මගින් සමාජානුයෝජනය ලබයි. ඒ අතර පෙර පාසල (Pre-School), පාසල (School), සම වයස් මිතුරු කණ්ඩායම් (Peer Groups) වැදගත් වේ (කුමාර, 2020: 271,272). මෙහි දී සාකච්ඡාවට බඳුන් වන්නේ සමාජානුයෝජන විෂයෙහි පාසලෙහි භූමිකාව කෙබඳු ද යන්න පිළිබඳව යි. ද්විතීයක සමාජානුයෝජන කාරකයක් වශයෙන් පාසල ක්‍රියාත්මක වන ආකාරය හා එහි කාර්යභාරය පිළිබඳ මෙහි දී කරුණු ඉදිරිපත් කෙරේ. දරුවකු පවුලෙන් ලබන අවිධිමත් සමාජානුයෝජනයට වඩා විධිමත් සමාජානුයෝජනයක් ලබන ආයතනයක් ලෙස පාසල නම් කළ හැකි ය. පවුලේ දී අක්‍රමවත් චර්යා නිදහස් ව විඳිමින් හැසිරුණු දරුවා ක්‍රමවත් කිරීම, හා කාලසටහනකට අනුව දිශාගත කිරීම පාසලෙන් සිදු වේ. මේ පිළිබඳ අදහස් දක්වන හේමන්ත කුමාර (2020) මෙසේ පවසයි. ''මෙතෙක් දරුවා තමන්ට අවශ්‍ය වෙලාවක නැගිටීම (පිබිදීම), කෑම ගැනීම, වැසිකිළි යෑම, සෙල්ලම් කිරීම, විවේකය ගත කිරීම යනාදිය කළ ද පාසල් ජීවිතය ඇරඹීමත් සමග ඒවා යම් රටාවකට (කාල සටහනකට) අනුව කිරීමට හැඩ ගැසේ.'' මේ


අනුව ද්විතීයක සමාජානුයෝජන කාරකයක් ලෙස පාසලින් ලබන පුහුණුව දරුවාට ඉතා වැදගත් වන බව පැහැදිලි ය. එබැවින් මෙහි දී සමාජානුයෝජනය විෂයෙහි පාසලෙහි භූමිකාව පිළිබඳ ව තොරතුරු සාකච්ඡා කෙරේ.

**සාකච්ඡාව**

සමාජානුයෝජනය ඉංග්‍රීසි භාෂාවේ "Socialization" යනුවෙන් හඳුන්වයි. මෙහි වචනාර්ථය සරල ව 'සමාජයට අනුගත වීම' ලෙස දැක්විය හැකි ය. දරුවකු උපතේ සිට විවිධ අවධි පසු කරන අතර එහි දී විවිධාකාරයට සමාජයට අනුගත වීමේ පුරුදු ඉගෙන ගනී. මූලික ව අවිධිමත් ලෙස හුරු පුරුදු වන චර්යා නිසි පුහුණුවකින් අනතුරු ව විධිමත් භාවයට පත්කර ගනු ලබයි. මෙම ක්‍රියාවලිය සැමට පොදු හා සාධාරණ නො වන අතර ඔහු හෝ ඇය දරුවකු ලෙස උපදින පරිසරය හා අනතුරු ව ඔවුනට හමුවන විවිධ සමාජය, පුද්ගලයින් අනුව ද එම ක්‍රියාවලියේ විවිධත්වයක් ගනී. සමාජානුයෝජනය පුළුල් ක්‍රියාවලියක් බැවින් එහි ප්‍රභේද රාශියයක් දැකිය හැකි ය. එසේ ම ඒ ඒ ප්‍රභේදවලට අයත් සමාජානුයෝජන කාරක (Agencies) ද පවතී. සමාජානුයෝජන ප්‍රභේද කිහිපයක් හේමන්ත (2020) මෙසේ වර්ග කරයි.

I. ප්‍රාථමික සමාජානුයෝජනය
II. ද්විතීයික සමාජානුයෝජනය
III. තෘතීයික සමාජානුයෝජනය
IV. පුනර් සමාජානුයෝජනය
V. අපේක්ෂිත සමාජානුයෝජනය
VI. සාවද්‍ය සමාජානුයෝජනය
VII. වැඩිහිටි සමාජානුයෝජනය
VIII. දේශපාලන සමාජානුයෝජනය

මෙම ප්‍රභේද අතරින් ඉතා වැදගත් වන ප්‍රභේද ත්‍රිත්වයක් ඇත. එනම් ප්‍රාථමික, ද්විතීයක සහ තෘතීයක සමාජානුයොජන ප්‍රභේද වේ. එහි ක්‍රියාකාරීත්වය කෙතරම් ක්‍රමානුකූල දැ'යි සහ පුළුල් දැ'යි වටහා ගැනීමට පහත රූප සටහන වැදගත් වේ.




(හේමන්ත, 2020: 273)

මෙම සටහන අනුව පැහැදිලි වන්නේ පුද්ගලයා ප්‍රාථමික සමාජානුයෝජනයේ සිට ද්විතීයික, තෘතීයික සමාජානුයෝජනය දක්වා ඉතා පුළුල් වෙමින් විහිදී යන බවයි. මෙසේ විහිදී යන සමාජානුයෝජන ක්‍රියාවලියේ සීමාවක් ද නොමැති බව සමාජවිද්‍යාඥයන්ගේ මතය යි. මෙම ප්‍රභේදවලට අයත් සමාජානුයෝජන කාරක රාශියක් පවතින අතර මෙහි දී අවධානය යොමු වන්නේ ද්විතීයක සමාජානුයෝජනට අයත් විධිමත් ආයතනයක් වන පාසල පිළිබඳ ව යි. පාසල සමාජානුයෝජන කාර්යයට දක්වන දායකත්වය විමසා බැලීම වැදගත් වනුයේ එම ක්‍රියාවලියේ පවතින විධිමත්භාවය හේතුවෙනි. සමාජයක ජාති, ආගම්, ගෝත්‍ර ආදි විවිධ කණ්ඩායම් දක්නට ලැබෙන අතර සෑම කණ්ඩායමක් ම තම තමාගේ සංස්කෘතික උරුමය ඊළඟ පරපුරට පවරා දීම සඳහා උත්සුක වේ. එය පහසු කාර්යයක් ද නො වන බැවින් මෙකී අවශ්‍යතාව පදනම් කර ගෙන අවදානමට මුහුණ දීමේ ප්‍රතිකර්මයක් වශයෙන් මෙන් ම, අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට හුරු වීම අවශ්‍ය වීමත්, කණ්ඩායමේ සුභ සාධනය සඳහා එකිනෙකා යම් යම් වගකීම් භාර ගත යුතු බව අවධාරණය කිරීමත් හේතු කොට ගෙන 'පාසල' බිහි වූ බව නිගමනය කරයි (ජයසේන, 2010: 135). මේ අනුව මුල් කාලයේ සරල සමාජ අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙන් ම පශ්චාත් කාලීන ව සංකීර්ණ සමාජ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ගුරු ගෙදර (දිසාපාමොක් අසපුව), පන්සල, පිරිවෙන ආදී ආයතන බිහි වූ බව සැලකිය හැකි ය. කාලයත් සමග උසස් කුලවලට අයත් වූවන් සඳහා අධ්‍යාපනය ලබා දීමට, ශාස්ත්‍රීය විෂයය දැනුම ලබා

දීමට මෙන් ම විවිධ භාෂා දැනුම, සෞන්දර්ය අධ්‍යාපනය ලබා දීම දක්වා සංවර්ධනය වී ඇත. මේ අනුව සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පාසලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ඕනෑ ම පුද්ගලයකු සමාජය තුළ ජීවත් වන ආකාරය, සමාජය සමග ගනුදෙනු කරන ආකාරය, විවිධත්වයට මුහුණ දෙන ආකාරය පුරුදු විය යුතු ය. සමාජ සංස්කෘතික අගයයන් පිළිබඳ අවබෝධය හා එහි හැසිරීම පිළිබඳ දැනුම පුද්ගලයාගේ පැවැත්මට වැදගත් සාධක වේ. නිවැරැදි අවබෝධයකින් සමාජයේ කටයුතු කිරීමට අපොහොසත් වීමෙන් පුද්ගලයාට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වේ. මේ අනුව දරුවකු සමාජානුයෝජනය කිරීමේ කාර්යයේ දී පාසලට විශාල වගකීමක් පැවරෙන බව පැහැදිලි ය. සමාජානුයෝජනය පිළිබඳ Meril Francis නම් සමාජ විද්‍යාඥයා පෙන්වා දෙන මූලික නීති හතරක් අමරසේකර මෙසේ දක්වයි

1. පුද්ගලයා සමූහයේ මූලික නීතිය උගත යුතුය.
2. සමාජ සමූහයේ පිළිගත් සම්මතවලට හැම විට ම අනුගත විය යුතු ය.
3. සංස්කෘතියට අත්‍යවශ්‍ය වූ ශිල්පීය ක්‍රම පිළිබඳ උගැන්මක් ලබා ගත යුතු ය.
4. පුද්ගලයා තමාට හිමි කාර්ය කොටස කුමක්දැ'යි නිශ්චිතව දැන ගත යුතු ය.

ඉහත කරුණු පිළිබඳ දැනුම ලබා ගැනීම පුද්ගලයාට ඉතා වැදගත් වන බැවින් එය සමාජයෙන් ආකස්මික ව ලැබේ යැ'යි විශ්වාස කිරීම අවදානමකි. එබැවින් ඒ පිළිබඳ අවබෝධය විධිමත් ආකාරයට ලබා දීම සඳහා පාසල යොදා ගැනීම යෝග්‍යය වේ. පාසලේ පවතින විධිමත්භාවය මත නිශ්චිත ව තීරණය කරන ලද කාර්යභාරයක් ඇත. එබැවින් පාසල සමාජානුයෝජනයේ දී දක්වන දායකත්වය උසස් කොට සැලකිය හැකි ය. පාසලක් විධිමත් ආකාරයට මෙන් ම අවිධිමත් ආකාරයට සමාජානුයෝජනයට අදාළ කාර්යභාරය සිදු කරනු ලබයි. එම විධිමත් කාර්යභාරය පිළිබඳ කරුණු කිහිපයක් සේනාධීර සහ හේවාපතිරණ (2010) මෙසේ දක්වා ඇත.

01. අවිනිශ්චිත අනාගතයකට මුහුණ දිය හැකි උපක්‍රමශීලී චින්තනය වර්ධනය කිරීම

02. විනිශ්චය කිරීමට සුදුසු විවේචනාත්මක චින්තනය සිතීමට සහ ක්‍රියා කිරීමට සුදුසු පරිදි වර්ධනය කිරීම

03. පැරණි සංස්කෘතික උරුමය ආරක්‍ෂා කිරීම සහ බාල පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීම

04. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපත් පුරවැසියකු වශයෙන් ජීවත් වීමට අවශ්‍ය නායකත්ව ලක්ෂණ ශිෂ්‍යයන් තුළ වර්ධනය කිරීම

05. සමාජයට සහ සමාජයේ අන් අයට කරදරයක් නොවන පරිදි තමා මුහුණ පාන ප්‍රශ්න තමාට ම විසඳා ගැනීමට පුහුණු කිරීම

06. ආධ්‍යාත්මික නිදහස සහ චරිතය ගොඩ නැගීම පිළිබඳ පුහුණුවක් ලබා දීම (Dhiman,1987: 133).

මෙසේ පාසල මගින් විධිමත් ආකාරයට සැලසුම් කළ පුහුණුවක් ලබා දෙන අතර අවිධිමත් අයුරින් ද සමාජානුයෝජනයට අවශ්‍ය කාර්යය සිදු කරන බව (Dhiman) පෙන්වා දෙයි. මෙසේ කවර ආකාරයට වුව ද පාසලෙන් සිදුවන්නේ සමාජානුයෝජනය බැවින් එය ඉතා වැදගත් වේ. පාසලේ අවිධිමත් කාර්යයන් පිළිබඳ ව සේනාධීර සහ හේවාපතිරණ (2010) පහත කරුණු පෙන්වා දෙයි. එම කරුණු වෙන් වශයෙන් මෙසේ දැක්විය හැකි ය.

01. ශාරීරික පුහුණුව (ක්‍රීඩා, ශිෂ්‍ය භට, යුද පුහුණුව, සෞඛ්‍ය කඳවුරු)

02. සමාජ පුහුණුව (සමාජ සේවා කඳවුරු, සමාජ රැස්වීම්)

03. චිත්තවේග පුහුණුව (වාද විවාද, නාට්‍ය, චිත්‍ර ප්‍රදර්ශන, සංගීත සංදර්ශන)

04. ක්‍රියාශීලී පරිසරය (නිර්මාණාත්මක සහ විනෝදය සඳහා කටයුතු, ආත්ම ප්‍රකාශන)

මේ අනුව පාසලක විධිමත් මෙන් ම අවිධිමත් අයුරින් ද සමාජානුයෝජනය සිදු වන බව පැහැදිලි ය. එමගින් ශිෂ්‍යයා තුළ වැඩිදියුණු වන පිළිවෙළ, දැක්ම ඔහුට සහ සමාජයට හිතකර පරිසරයක් නිර්මාණය වීමට දායක වෙයි. මේ අනුව වර්තමානයේ එම කාර්යභාරයේ දී විශාල වගකීමක් පාසලට පැවරේ. ඕනෑම සමාජයක් වේගයෙන් සංවර්ධනය වෙමින් සංස්කෘතික විවිධත්වයට ලක් වීම සිදු වේ. එබැවින් අවශ්‍ය දැනුම හා ආකල්ප කාලීන ව සකස් කරමින් විධිමත් ව බාල පරපුරට පවරා දීම නවීන පාසල සතු ප්‍රබල ම කාර්යභාරය ලෙස සැලකේ (ජයසේන, 2010: 134). පාසලින් දරුවා ලබන ඉගෙනුම දෙයාකාරයකින් සමාජානුයෝජනයට ආධාරක වේ (අමරසේකර, 2016: 93). එනම් විෂයය දැනුම සහ සමාජ දැනුම යි. පාසල් අධ්‍යාපනය මගින් විවිධ විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලබා ගැනීමට හැකි වන අතර එම දැනුම දරුවා තවදුරටත් ඉදිරියට යාමට පෙළඹවීමක් බවට පත් වේ. පාසල මගින් ලැබෙන අනෙක් දැනුම වන සමාජ දැනුම විවිධාකාරයට පාසලෙන් ලැබෙයි. විවිධ සමවයස් කණ්ඩායම් සහ විවිධත්වයෙන් යුතු පුද්ගල චරිත මගින් දරුවාට සමාජ දැනුම ලබා ගැනීමේ අවස්ථාව පාසලේ දී උදා වේ. මේ අනුව පාසලේ දී නිසි පරිදි සමාජානුයෝජනය සිදු වීමට පාසලේ භෞතික මෙන් ම මානව සම්පත ද වැදගත් වන බව පැහැදිලි වේ. නිසි කළමනාකරණ ක්‍රමවේදයකින් තොර පාසලක් සහ එහි ඉගැන්වීම් සිදු කරන ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරන මට්ටමේ සමාජානුයෝජන ක්‍රියාවලියක් සිදු වේ යැ'යි අපේක්ෂා කළ නො හැකි ය. එබැවින් පාසලක පරිපාලනය මෙන් ම ගුරු භවතුන්ගේ ක්‍රියා කලාපය ද බොහෝ දරුවන්ගේ චර්යාමය වෙනස්කම් ඇති කිරීමට හේතු සාධක වේ. 'පාසල තුළ දී සිසුවා ලබන සමාජානුයෝජනය පරිපූර්ණ මට්ටමට පත් කිරීමෙහි ලා ගුරුවරුන්ගේ ක්‍රියාකලාපය බොහෝ දුරට ඉවහල් වන්නේ ය' යන ඩබ්.අයි. තෝමස් මනෝවිද්‍යාඥයාගේ ප්‍රකාශය ඉහත කරුණු තවදුරටත් තහවුරු කරයි.

පාසල් අධ්‍යාපනය ලබන දරුවා විවිධ දැනුම් මට්ටම් පසු කිරීමත් සමග ඔවුන් විවිධ අංශ කෙරේ නැඹුරුතාවක් දැක්වීමට

පෙළඹේ. ඒ සඳහා ඔවුන් හදාරන විෂය මෙන් ම පාසලේ බාහිර ක්‍රියාකාරකම් ද ඉවහල් වේ. මෙහි දී ඉතා ම වැදගත් වන්නේ විවිධ අත්දැකීම් දරුවාට ලැබීමයි. ප්‍රාථමික සමාජානුයෝජනය මගින් නිවසේ දී ලැබූ අක්‍රමවත් අත්දැකීම් පාසලෙන් ක්‍රමවත් ව ලැබෙන විට ඒවා තහවුරු කර ගැනීමට සහ පිළිගැනීමට දරුවා පෙළඹේ. දිගින් දිගට දරුවාට ලැබෙන පාසල් අත්දැකීම් ඇසුරෙන් නව ආකල්ප ගොඩ නගා ගන්නා දරුවා නව නිර්මාණකරණයට මෙන් ම නව ප්‍රවේශ වෙත අවතීර්ණ වේ. මේ සඳහා පාසලේ විවිධත්වයෙන් යුක්ත ඉගැන්වීම් ක්‍රම සහ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම ද විශාල මෙහෙවරක් ඉටු කරයි. දරුවකු පවුලෙන් පිට ව ඥාතීන් නො වන විශාල පිරිසක් සමග කටයුතු කරන්නේ පාසලේ දී ය. මෙම කාලයේ පාසලෙන් ලබන සමාජානුයෝජනය රැකියාවක් කරන තුරු මෙන් ම විවාහයක් වන තුරු පුද්ගලයාට ප්‍රබල ලෙස බලපායි (ගලගමගේ, 2019: 63,64). මෙසේ ගොඩ නැගෙන සමාජ සබඳතා ජාල ජීවිත කාලය පුරා ම බලපෑමට සමත් බව ඔහුගේ අදහසයි. මෙසේ පාසලෙන් සිදු වන සමාජානුයෝජන ක්‍රියාවලිය නිසි ලෙස විග්‍රහ කිරීමට නම් පාසල් අභ්‍යන්තරයේ සිදු වන ක්‍රියාවලිය ද නිරීක්ෂණයට භාජනය කළ යුතු බව ජයසේනගේ (2010) අදහස යි. තව ද ළමයා පාසලේ දී ලබන සමාජානුයෝජනයේ ස්වභාවය තීරණය කිරීමට ළමයා පාසලට ගෙන එන සමාජ පසුබිම ද බලපෑම් කරනු ලබන බව ජයසේනගේ අදහසයි. බර්නස්ටීන්, (1977) පවසන අන්දමට පාසල් සංස්කෘතියේ ඇති අදෘශ්‍යමාන ශික්ෂණ විද්‍යාවක් හෝ සැඟවුණු තරාතිරමේ පද්ධතියක් මගින් ශාස්ත්‍රීය සාධනය කෙරෙහි බලපෑම් හා එමගින් ළමයින්ගේ දීර්ඝ කාලීන ජීවිත අවස්ථා තීරණය කිරීම අනිවාර්යයෙන් ම සිදුවන බව පවසයි (ජයසේන, 2010: 137). මේ අනුව විමසා බැලීමේ දී පාසල සමාජ පද්ධතියක් වශයෙන් සුවිශාල වගකීමක් ඉටු කරනු ලබයි. සමාජ පද්ධතියක් වශයෙන් ටැල්කොට් පාසන්ස් පෙන්වා දෙන පාසලෙන් කෙරෙන ක්‍රියාවලි හතරක් පිළිබඳ ගලගමගේ, (2019) මෙසේ දක්වයි.

1. ළමයා පවුල සමග පැවති භාවාත්මක සබඳතාවලින් නිදහස් කර ගැනීම.

2. පවුලට වඩා ඉහළ මට්ටමකින් සමාජ අගය ප්‍රතිමාන අභ්‍යන්තරීකරණය කිරීම.

3. පාසලේ පන්තිය තුළ කරන කියන හොඳ දේ විවිධාකාරයෙන් ඇගයීම.

4. වැඩිහිටි භූමිකා පද්ධතියට අවශ්‍ය මානව සම්පත තේරීම, වෙන් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබා දීම.

මේ අනුව පාසලේ දී ඉගෙනීම මෙන් ම තවත් සුවිශේෂී කාර්යය රාශියක් බලාපොරොත්තු වන බව පැහැදිලි ය. මේ අනුව සමාජානුයෝජනය විෂයෙහි පාසලට පැවරෙන කාර්යය විශාල වේ. එබැවින් පාසලෙන් සිදු වන සමාජානුයෝජනය මගින් දරුවන් තුළ පවතින විවිධත්වයට ගරු කරන සහ විවිධත්වය පිළිගැනීම දියුණු කළ යුතු ය. සමාජයේ පවතින බහු වාර්ගික හා බහු ආගමික විවිධත්වය හේතුවෙන් ඊට උචිත ලෙස කටයුතු කළ හැකි දරුවන් අනාගතයේ අවශ්‍ය වේ. ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක්, දීර්ඝකාලීන සැලැස්මක් පාසල සතු විය යුතු ය. වෙනත් කවර කණ්ඩායමකට නො කළ හැකි මට්ටමේ විශාල කාර්යයක් පාසල විසින් සිදු කරන බව මෙමගින් පැහැදිලි ය. එම කාර්යවල පාසලට පැවරෙන වගකීම් හඳුනා ගෙන සිටීම වැදගත් වේ. නිසි පරිදි සමාජානුයෝජනයට අවශ්‍ය ක්ෂේත්‍ර පාසල තුළ ක්‍රියාත්මක කිරීම මගින් පාසලෙන් අපේක්ෂිත අරමුණු සඵල කර ගත හැකි වේ.

දරුවකු ප්‍රථමයෙන් පවුල මගින් ලබන අවිධිමත් සමාජානුයෝජනය සමාජය සංකීර්ණ වීමත් සමග ප්‍රමාණවත් නො වී ය. තාක්ෂණයේ ඇති වී තිබෙන සංවර්ධනයත්, අතීතයේ පැවති විස්තෘත පවුල් රටාවේ දුර්වල වීමත් සමග සංස්කෘතිය පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය අඩපණ විය. අතීතයේ පවුල තුළින් දරුවන්ට දැනුම මෙන් ම ආකල්ප ද ප්‍රමාණවත් පරිදි ලැබුණු නමුත් විවිධ සමාජ වෙනස්වීම් මත එය සිදු වන ප්‍රමාණය අල්ප වී ඇත. මෙයට පිළියමක් ලෙස විවිධ ක්‍රම සෙවීමට සිදු විය. එබැවින් මෙයට පිළියමක් ලෙස යොදා ගත් උපකරණය වන්නේ අධ්‍යාපනයයි (ජයසේන, 2010: 134). ඒ අනුව සංස්කෘතිය පරපුරෙන් පරපුරට පවරා දීම සඳහා බිහි කරන ලද විධිමත් ආයතනය පාසල යි.

දරුවකු පවුලෙන් මූලික ව කන බොන, අඳින පළඳින කතා කරන ආදී බොහෝ දෑ අවිධිමත් ව ඉගෙන ගනී. එහි දී දරුවකුට දරුණු

සීමාවන් හෝ තදබල සදාචාර නියම නොමැත. එසේ ම නියමිත වේලාවකට හෝ නියමිත ක්‍රමයකට කොටු වීමක් ද නොමැත. එහෙත් ක්‍රමයෙන් දරුවා වැඩෙත් ම එම චර්යා සියල්ලෙහි ක්‍රමානුකූලත්වයක්, පිළිවෙළක් අත්‍යාවශ්‍ය වේ. මහ සමාජයේ සාමාජිකයකු ලෙස විශාල පිරිසක් සමග කටයුතු කිරීමට, විවාහ ජීවිතයක් ගත කිරීමට මෙන් ම වෘත්තීය ජීවිතයට ආදී වශයෙන් විධිමත් සමාජ දැනුමක් අවශ්‍ය වේ. ඒ සඳහා පාසලෙන් විධිමත් ව ලැබෙන අධ්‍යාපනය පුද්ගලයා සමාජයට අනුගත කිරීම සඳහා ඉවහල් වේ. එබැවින් මෙම භාරධූර කාර්යය ඉටු කරන පාසල නමැති සමාජානුයෝජන කාරකයට විශාල වගකීමක් පැවරේ. දරුවන්ට අනාගත සමාජයට නොබියව මුහුණ දීමටත්, ජීවත් වීමටත් අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතාව විධිමත්ව හා සැලසුම් සහගත ව පාසලෙන් ලබා දිය යුතු ය. එසේ පාසලෙන් විධිමත් ව ලබා දෙන අධ්‍යාපනයෙන් දරුවා සමාජානුයෝජනය වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

අමරසේකර, ඩී. (1987). *සමාජ විද්‍යාවේ මූලික සංකල්ප*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

ජයසේන, (2010). *අධ්‍යාපන සමාජ විද්‍යාව*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10.

ගලගමගේ, එස්. (2019). *අධ්‍යාපනයේ සමාජවිද්‍යාත්මක පදනම*, තරංජි ප්‍රින්ටර්ස්, නාවින්න.

අමරසේකර, (2016). *සමාජ විද්‍යාව සිද්ධාන්ත හා විධික්‍රම*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10.

සේනාධීර, සහ චිත්‍රාංගනී හේවාපතිරණ (2010). *අධ්‍යාපනය සඳහා සමාජානුයෝජන කාරකවල වැදගත්කම*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10.

හේමන්ත කුමාර, එන්.වී.ජී.ඒ. (2020). *සමාජ විද්‍යාව: මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේදය*, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මරදාන පාර, පුංචි බොරැල්ල.

Dhiman, O.P.(1987). *Foundations of Education.* Delhi, Alma Ram.